ඇතැම් මාධ්‍ය තුළ දක්නට ලැබෙන යම් යම් පුවත් වාර්තාවන්හි දී, කාන්තාව පමණක් වැඩි වශයෙන් සෘණාත්මකව ඉස්මතු කෙරෙන ආකාරයේ වාර්තාකරණයන් දක්නට ලැබේ. පහත දැක්වෙන පුවත් වාර්තාවන් ඊට උදාහරණ වේ.

මෙහිදී කොස්තාපල්ගේ රාජකාරියට බාධා කිරීම යන වරද සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත්තේ "කාන්තාවන් 2 ක් සමග 6 කි"!

එහිදී එකම වරද සිදුකළ හයදෙනෙකුගෙන් කාන්තාවන් දෙදෙනා පමණක් ඉස්මතු කිරීම ඔස්සේ, කාන්තාව කළ වරදට වැඩි බරක් යොදා පෙන්වීමක් දක්නට නොලැබෙන්නේද? එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක්, ඇයට වෙනස් වූ සැලකිල්ලක් දැක්වීමක් නොවන්නේද? ඒ අනුව මෙය ආචාරධාර්මික නොවන වාර්තාකරණයක් ලෙසින් හඳුන්වා දීමට සිදුවනු ඇත.